# පබ්බජ්ජා විනය නීතින්හි සංවර්ධනයඃ විචාරාත්මක විග්‍රහයක්

හතරබාගේ සුගතවංස හිමි[1]

## හැඳින්වීම

පබ්බජ්ජාව යනු ගිහි ජීවිතයෙන් ඉවත් ව පැවිදි ජීවිතයකට පිවිසීමයි. එහි දී අනුගමනය කළ යුතු පිළිවෙත් විනය පිටකයෙහි ඇතුළත් වන අතර ඒ අනුව ක්‍රමානුකූල පිළිවෙතකට ගිහියකු පැවිදි කිරීම සිදු කරනු ලැබෙයි. මහාවග්ගපාළියේ මහාක්ඛන්ධකයට අනුව පැවිද්ද හා උපසම්පදාව ආරම්භයේ දී එක්ව පැවති අතර පසුකාලීනව දෙකක් බවට පත්විය. සසුනේ විකාශනයත් සමඟ පැවිදි කිරීම සම්බන්ධයෙන් විටින් විට නීති සම්පාදනය විය. බුදුරදුන් ජීවමාන සමයේදී ම පැවිදි කිරීම සම්බන්ධයෙන් පැවති විනය නීති විටින් විට සංවර්ධනය වූ බව මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් දැකගත හැක. ඒ අනුව වර්තමානයේ පැවිදි කිරීම සම්බන්ධයෙන් ශාසනය තුළ ක්‍රියාත්මක වනුයේ බුද්ධ විනයම ද යන්න විමසීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි.

## ක්‍රමවේදය

මෙහි දී සාහිත්‍ය මූලාශ්‍ර පදනම් කරගත් පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කරන ලදී. විනය පිටකය හා විනය අටුවා, කතිකාවත් මෙහිලා ප්‍රමුඛව පරිශීලනය කෙරිණ. ඊට අදාළ ද්විතීයික මූලාශ්‍රය ද සමීපව විමර්ශනය කරන ලදී.

## සාකච්ඡාව

පබ්බජ්ජාව හෙවත් පැවිද්ද සඳහා පණ්ඩුපලාස අධ්‍යාපනය, සාමණේර පැවිද්ද, වයස් සීමාව, දෙමාපිය අවසරය, පැවිදි කිරීමට සුදුසු නුසුදුසු පුද්ගලයන් ආදි කරුණු සඳහා විනය නීති පැන වී ඇති අතර කාලයත් සමඟ ඒ ඒ විනය නීති සංශෝධනය ද වී ඇත. ලක්දිව දී එම විනය නීති ලක්දිවට ආවේණික අයුරකින්, දේශපාලනික හා සාමාජීය ආදි විවිධ කරුණු හේතුවෙන් සංශෝධනය වී තිබේ. ඒ බව ලක්දිව දී රචිත විනය ග්‍රන්ථ හා කතිකාවත්, ශිලා ලේඛන විමසීමෙන් දත හැකිය. උක්ත විනය නීති මුල් බුදු සමයට පසුකාලීනව භාරතයේ දී මෙන්ම ලක්දිව දී ද සංශෝධනය වී ඇත.

---

1 තාවකාලික නිබන්ධක, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සාමණේර පැවිද්ද ආරම්භ වූයේ රාහුල කුමරුන්ගේ පැවිදි කිරීමත් සමඟ ය. රාහුල කුමරුන් දායාද ඉල්වමින් බුදුරදුන් පිටුපසින් විහාරයට පැමිණි විට උන්වහන්සේ ඔහුට ශාසනික දායාදය ලබාදීම සඳහා පැවිදි කරන ලෙස සැරියුත් හිමියන්ට පැවරූහ. එහි දී සාමණේර පැවිද්ද හඳුන්වා දුන්හ. මේ අනුව එක්ව පැවති පැවිදි උපසම්පදාව, සාමණේර හා උපසම්පදා වශයෙන් සාසනය තුළ ප්‍රභේද දෙකක් උද්ගත විය. පළමුව තිසරණගමන පැවිද්ද ආරම්භ වූ අතර පසුව සාමණේර පැවිද්ද සඳහා දශ ශික්ෂාවන් නියම කළහ. පසුව සුද්ධෝදන රජු කළ ඉල්ලීමත් සමඟ දෙමාපියන්ගේ අවසරය නොමැතිව දරුවන් පැවිදි නොකරන ලෙස බුදුරජාණන් වහන්සේ නීතියක් පැනවූහ. මේ අයුරින් විකාශනය වූ පැවිද්ද ලක්දිව දී නොයෙක් ආකාරයේ වෙනස්වීම්වලට භාජන වී ඇත. ඒ බව ලක්දිව කතිකාවත් හා ශිලාලේඛනාදිය විමසීමෙන් දැකගත හැකිය. විශේෂයෙන් කතිකාවත් තුළ පබ්බජ්ජාව සම්බන්ධයෙන් කරුණු අන්තර්ගත වෙයි. එහි දී ත්‍රිපිටකයෙහි ඇතුළත් විනය නීතීන්ට පරිබාහිර කරුණු අන්තර්ගත වෙයි. එනම් විනය නීතීන්ගේ සංවර්ධනය යි.

පණ්ඩුපලාස යනු පැවිද්ද අපේක්ෂාවෙන් පා සිවුරු පිළියෙල කර ගන්නා තැනැත්තා ය. සිවුමස් පණ්ඩුපලාස අධ්‍යාපනයක් ලැබිය යුතු බව සඳහන් වේ. නමුත් මහාවංශයෙහි සඳහන් වන අන්දමට මහණ වීමට අවුරුද්දකට අඩු කාලයක් භික්ෂු ඇසුරෙහි සිටීම වරදක් නො වන බව යි. දඹදෙණි කතිකාවතෙහි දැක්වෙන්නේ එය එක් අවුරුද්දක් පමණ විය යුතු යන්න යි. කළුදියපොකුණ සෙල්ලිපියෙහි දැක්වෙන්නේ සතර බණවර දැනගත් කුල දරුවන් මහණ කරන ලෙස ය. සතර බණවර, ධම්පියා ව ලිවීම හා කියවන්නට හැකි අයුරින් පුහුණු කර මහණ කරවන ලෙස විනය නීතියක් ලෙස පනවා ඇති අතර චතුපාරිශුද්ධ ශීලය හා සතර කමටහන් ද ප්‍රගුණ කළ යුතු බව සඳහන් ය. මහණ වීමට මත්තෙන් කුලපුත්‍රයෙකු සකස් කළ යුතු ආකාරය විනය පිළිබඳව විවිධ මතවාද සමඟින් සංවර්ධනය වූ බව පැහැදිලි වේ.

පැවිදි කිරීමේ වයස් සීමාව පිළිබඳව විවිධ මතවාද පවතී. ඊට හේතුව බුද්ධ කාලයේ දී පැවති විනය නීති පසුව සංශෝධනය වීමයි. සාමණේර පැවිද්ද සඳහා වයස් භේදයක් ආරම්භක අවධියේ දී නොවීය. එහෙත් අහිවාතක රෝගයකින් සියලු ඥාතීන් මියගිය පියෙකු හා ඔහුගේ පුතු පැවිදිවීම නිසා උද්ගත වූ ජනතා විරෝධය හේතුකරගෙන පසළොස් වියට අඩු දරුවන් පැවිදි නොකරන ලෙසට නව නීතියක් පනවන්නට බුදුරදුන්ට සිදුවිය. එහෙත් පසුව එම වයස් තීරණය ද වෙනස් විය. අනඳ තෙරුන්ගේ දායක පවුලක මාපියන් අභාවයට පත්ව දරුවන් පමණක් ඉතිරි වූ විට ඔවුන්ට පිළිසරණ වීමට අවශ්‍ය වූ නිසා තමා සමීපයට පැමිණෙන කපුටෙකු

එළවිය හැකි පසළොස් වියට අඩු දරුවන් පැවිදි කරන්නට එහි දී බුදුරදුන් අවසර දෙන ලදී. 5 වන කාශ්‍යප රජුගේ සෙල් ලිපියෙහි දැක්වෙන්නේ පිරිත් පොත සහ සතර බණවර උගත් අය පමණක් මහණ කිරීමට අවසර තිබෙන බව යි. දඹදෙණි කතිකාවතෙහි දක්වා ඇත්තේ ගම්වාසයට ඇතුළත් වීමේදී වයස අවුරුදු 12ක් විය යුතු බවත් වනවාසයට ඇතුළු වීමේ දී අවුරුදු 14ක් විය යුතු බව යි.

පැවිදි කිරීමට නුසුදුසු පුද්ගලයන් දැක්වීමේ දී කුෂ්ඨ, ගණ්ඩ, ගෙඩි, වන හා අපස්මාර යන රෝග ඇති අය මහණ කිරීමට නුසුදුසු පුද්ගලයන් ලෙස සලකා ඇත. මෙම නියමය කාලනුරූපව වෙනස් වී ඇති බව ලක්දිව දී රචිත විනය ග්‍රන්ථ, ශිලා ලේඛන හා කතිකාවත් විමසීමෙන් දැකගත හැක. මේ පිළිබඳව සමන්තපාසාදිකාවෙහි දැක්වෙන්නේ අර්ශස්, පිත්, සෙම්, කාස, ශ්වාස යන රෝගයන් ය.

**සමාලෝචනය**

මෙයින් පෙනෙනුයේ කාලානුරූපව මෙන් ම දේශානුරූපව ද පබ්බජ්ජා විනය නීති සංවර්ධනය මෙන්ම වෙනස්කම්වලට භාජන වී ඇති බවයි. වර්තමානය වන විට උක්ත විනය නීති උක්ත සන්දර්භයට යටත් ය. පබ්බජ්ජාව හෙවත් පැවිද්ද සම්බන්ධයෙන් මුල්බුදු සමයේ පැවති විනය නීති මේ දක්වා පැමිණීමේ දී සංවර්ධනයට හා වෙනස්කම්වලට ලක්ව ඇත. පබ්බජ්ජාව සම්බන්ධයෙන් වූ විනය නීති බුද්ධ කාලයේ දී ම සංවර්ධනය වූ අතර ලක්දිව දී ද නීති අනන්‍ය ලක්ෂණයන්ගෙන් යුක්තව සැකසී ඇත.

**ප්‍රමුඛ පද**: විනය නීති, පබ්බජ්ජාව, සාමණේර පැවිද්ද, කතිකාවත්, ලක්දිව